1 වෙනි පිටුවෙන්

### බෙදුම් වාදයට ඉඩ නොදෙන් !

ළඟදී පැවැත්වීමට ඇති යාපනය සහ වවුනියා නාගරික සභා ඡන්දය නිසි පරිදි පැවැත්වීමට කටයුතු යොදා තිබීම සතුටට කරුණකි. මෙය ඒ සමාජ සහභාගිත්වයට ආරම්භයක් මෙන්ම උතුරේ ජනතාව ගේ අදහස් උදහස් අද කෙසේදැයි උරගා බැලීමට අනර්ඝ අවස්ථාවක්ද වනු ඇත.

### රට හැදීමේ සකල ජාතික මෙහෙවර

උතුරු වසන්තය රටේ ඉදිරියට විසඳීමට ඇති ප්‍රශ්න වලින් උතුරු පළාතේ ත්‍රස්ත පීඩන වලට කෙලින්ම භාජනය වූ ජනයා සඳහා ඉටුවිය යුතු වැඩ කොටසයි. ඒ ලෙසටව දශක තුනකට වැඩි කාලයක් අප මුළු රටටම මේ ත්‍රස්ත ව්‍යාපාර සහ යුද්ධය ඉදිරි ගමනට ඒදිරිව අහිතකර ලෙස බලපෑ බව කවුරුත් දනිති. උතුරේ මෙන්ම දකුණේද, මධ්‍යම ප්‍රදේශවලද මංමාවත් පහසුකම්, වාරිමාර්ග, විදුලිය, පානීය ජලය සැපයීම්, සෞඛ්‍යය, අධ්‍යාපනය ආදීන් නගාලීම වැනි අත්‍යවශ්‍ය කටයුතු රාශියක් මේ වසර තිහක් පමණ කාලයේ අතපසුවී පැවතිණ. කොළඹ ඉන්නා සුඛොපොභෝගී ජීවිත ගතකරන ටික දෙනාට නොදැනුනද කොළඹම වුව මුඩුක්කු පැල්පත් ජනතාව හොඳින් දනිති. සමහර ගම්බද ප්‍රදේශවල ජනතාව අදද පහසුකම් ලබන්නේ ජීවත්වන්නේ 2009 ට වඩා අර්ධ ශතවර්ෂයකට පිටුපසිනි. උදාහරණයක් වශයෙන් තවම හරියට මංමාවත් නැති නිසා ලෙඩුන් පුටුවේ තබා ඔසවාගෙන මහපාරක් ළඟට සැතපුම් ගණනාවක් ගෙන ඒමට සිදුවන තත්වයක් ඈත පිටිසර සිංහළ ගම් ප්‍රදේශවල අදද පවතී. තිබුණු ගම්බද පාසැල් ද අද වැසී ගොස් ඇත. ගුරුවරුන් මේ පාසැල් වලට එන්නේත් නැත. අත පසුවී ඇති මේ කාරණ රාශයක් සපුරාලීම සඳහා රට හැදීමේ දැවැන්ත ජාතික මෙහෙවර ඉදිරියට පවතී.

### ඊනියා ජාතික ප්‍රශ්නයක්

දැන් දැන් නැවත වරක් මේ ඊනියා ජාතික ප්‍රශ්න සංකල්පයක් විවිධ බෙදුම්වාදී මතධාරීන් විසින් මතුකරලන්නට බලනු පෙනේ අප රට සිටි සකල ජනතාව අනාද-මත් කාලයක සිට සිංහළ රජකාලයේ එවිට සිංහළ ජාතිය වශයෙන්ද අධිරාජ්‍යවාදී යුගයේ පැවතුනේද නිදහස ලැබුයේද එකම ජාතියක් එනම් සිලනීස් නේෂන් වශයෙනි. ඒ එකම ජාතිය සිංහළ දෙමළ මුස්ලිම් මැලේ බර්ගර් ආදී වාර්ගික කොටස් වලින් සමන්විත විය. ජාතික ප්‍රශ්නයක් මතුවන්නේ එකම භූමියක ජාතීන් කීපයක් අතර ගැටුම් ඇතිවීම මත ය. හොඳම උදාහරණය නම් ඓතිහාසික වශයෙන් පලස්තීනය ලෙස පැවති භූමි භාගයේ සිටි පලස්තීන ජාතිය මත්තට බ්‍රිතාන්‍යය සහ ඇමරිකාව ප්‍රමුඛ බටහිරයින් විසින් යුදෙව් ජාතිකයින් ගෙනැවිත් දමා 1947 දී ඊශ්‍රායෙලය පිහිටුවීමෙන් ඇති වූ ඒ ජාතික ප්‍රශ්නය අදත් විසඳී නැතිවීමයි.

අප රටේ තිබුණේ ද, ඇත්තේ ද එකම ජාතියකි. එදා සිලනීස් ( Ceylonese) වශයෙන් හැඳින්වූ, අද ශ්‍රීලංකන්ස් ( Sri Lankans) වශයෙන් හැඳින් වෙන ශ්‍රීලාංකික ජාතිය පමණකි. එය අර ඉහත දැක්වූ ජන වාර්ගික කණ්ඩායම් වලින් සමන්විත ය.

### බෙදුම්වාදයේ සුල මුල

මෙය ජාතික ප්‍රශ්නයක් වශයෙන් හැඳින්වීමට පටන්ගත්තේ මුල සිටම බෙදුම්වාදී මගකට යොමු වූ සමහර ද්‍රවිඩ කණ්ඩායම් විසින් පමණකි. නිදහස ලැබෙන අවස්ථාවේ ජී. ජී. පොන්නම්බලම් මහතා ද්‍රවිඩ සංගමයක් (Tamil Congress) පිහිටුවාගෙන බලයෙන් පනහට පනහක් ඉල්ලමින් සිංහළ ද්‍රවිඩ ජාතීන් වෙන්කොට නිදහස ඉල්ලීය. සෝල්බරි කොමිෂමෙන් එය ඉවත ලූ පසු හෙමින් සීරුවේ ඩී. ඇස්. සේනානායක රටේ ප්‍රථම අගමැතිතුමා යටතේ පිහිටවූ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ කර්මාන්ත ඇමතිවීමෙන් පසු ඔහුගේ බෙදුම්වාදය අවසන් විය.

එයට පසු බෙදුම්වාදය නැවත මතුකර වූයේ 1956න් පසු එස්. ජේ. වී. චෙල්වනායගම් මහතාගේ නායකත්වයෙන් පිහිටුවාගත් පෙඩරල් පක්ෂය විසිනි. ඉංග්‍රීසියෙන් රට පාලනය ගෙනගිය වරප්‍රසාද ලත් පන්තියට හිමිව තිබුණු පාලනයේ විශේෂ අයිතිවාසිකම් බිඳ දමමින් ඉංගිරිසිය වෙනුවට සිංහළ රාජ්‍ය භාෂාව කිරීමට එරෙහිව මොව්හු අරගල ඇරඹූහ. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය (ඉලංකෙයි තමිල් අරසු කච්චි) යනු වෙන් ද්‍රවිඩයනට සිය ව්‍යාපාරය හැඳින් වූ මොවුහු ඉංගිරිසියෙන් එය පෙඩරල් පාලනයක් ඉල්ලීම ලෙස හඳුන්වමින් සම්පූර්ණ බොරුවක් කළහ.

මේ ධනපති ද්‍රවිඩයනට උවමනා කළ දෙමළ බසක් ද නැත. කොළඹ සැප විහරණයෙන් පිරි මන්දිරවල සිටි මොවුනට ඕනෑ කළේද කොළඹ මන්දිර වල සිටි නමින් පමණක් සිංහළ වූ ධනපතිනට උවමනා කළ දෙයමය. එනම් සිය වරප්‍රසාද ආරක්ෂාකර ගැන්මට ඉංගිරිසිය රජකරවා දිගටම පවත්වා ගැනීමය.

### හණමිටි කරගහගත් පරණ වාමාංශිකයෝ

ද්‍රවිඩ කණ්ඩායම් බෙදුම්වාදයට පදනම් දමත්ම අප අතර සිටි පරණ වාමාංශික පන්ඩිතයින්ද ඒ පරණ හණ මිටි කරගහගෙන උන්ට උල්පන්දම් දුන්හ. තවමත් මේ 70 - 80 දශක වල මානසිකත්වයෙන් පසුවන මේ අයගේ නෂ්ටාවශේෂ තවමත් මේ බෙදුම්වාදී සංකල්ප මත ගොඩනැගුණු විසඳුම් වලින් මිදී නැත. මොවුන් අදත් ඊනියා ජාතික ප්‍රශ්නයක් ඇදගෙන බලය බෙදීම ගැන කතාකිරීමෙන් මෙය පෙනී යයි.

### ද්‍රවිඩ බෙදුම්වාදි ඊළාම් ත්‍රස්තවාදය

ද්‍රවිඩ බෙදුම්වාදීන් මෙසේ ඉදිරියට ගෙන ගිය ව්‍යාපාර 1970 දශකයේ අවසානය වනවිට ඊළඟ ද්‍රවිඩ පරම්පරාවේ තරුණ කණ්ඩායම් විසින් මෙහෙයවන ලද සන් නද්ධ අරගලයක් බවට ක්‍රමයෙන් පත්විණ. මේවායේ නායකත්වය හිමිකරගත් අන්ත දාමරිකයෙකු වූ ප්‍රභාකරන්ගේ කල්ලිය ප්‍රබලම කල්ලිය බවට පත්විය. ඒ වනවිට ඔඹබත නමින් හඳුන්වාගත් ඒ මුල් පෙඩරල් පක්ෂයේ නායක අමිර්තලිංගම් පවා ඝාත නය කරලීමෙන් ප්‍රභාකරන්ගේ LTTE ය කරළියට ආවේය. එයට පසු ඉදිරිකාලයේ දී මධ්‍යස්ථ ද්‍රවිඩ නායකයන් පවා ඝාතනය කරමින් ඒ LTTE ය අන්තම ත්‍රස්තවාදී කණ්ඩායමක් වූ ආකාරය අපි දනිමු.

1983 සිට රටට වින කළ මේ බෙදුම්වාදී ත්‍රස්ත කණ්ඩායම ජීවිත දහස් ගණනක් බිලිගත්හ. මේ 2009 වසරේදී ළඟදී ඔවුන් සම්පූර්ණයෙන්ම විනාශකර දමන තුරු උන් කළ අති මහත් විනාශය කොපමණ දැයි දුක් වින්ද සිංහළ මෙන්ම දෙමළ ජනතාවද හොඳින් දනිති.

### වසර 25 කට පසු දැන් තත්වය

වසර විසි පහක් තුළ ඊළඟ පරම්පරාවල සිංහළ මෙන්ම ද්‍රවිඩ ජනතාව තමන් ලත් අත්දැකීම් මත ඒ බෙදුම්වාදී මානසිකත්වයෙන් මිදී ඇතයි සිතිය හැකිය. නමුත් ඊයේ පෙරේදා නැවත අර හණමිටි මානසිකත්වයෙන් බෙදුම්වාදීන් ඒ කතා ඇදගෙන පරණ මිනී වලවල් ගොඩලෑමට දැඟලූහ. ඒ නිසාම එයට ප්‍රතිවිරුද්ධ කතාද මතුවිණ. මේවායේ භයානකකම තේරුම්ගත් නිසාදෝ ජනාධිපතිතුමා කාටත් මතක්කර දුන්නේ දැනට ප්‍රමුඛත්වය ගෙන ඇති අප මෙහි ඉහත සඳහන් කළ දෑ ඉටු කිරීමෙන් පසු පවත්වන ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු සකල ජනතාවට බලපාන විසඳුම් මාර්ගයකට එළඹිය හැකි බවයි ඒ පැහැදිලි ප්‍රකාශයෙන් පසු කවුරුත් නිශ්ශබ්ද වී ඇත.

සිංහළ ද්‍රවිඩ දෙකොට්ඨාශයටම අවශ්‍ය වී ඇත්තේ බෙදුම්වාදයෙන් සිදු වූ හානියෙන් ගොඩ ඒමටය. මේ අර භයා ඉදිරියේ කරණ සාමූහික ප්‍රයත්න තුළින් දෙකට්ටිය අතර නව සබඳතා ගොඩ නගාගැන්මට හැකි වෙනවා ඇත. අනාගතය ගොඩ නැගෙන්නේ වර්තමානයෙන් ඔබ්බට යෑමට මිනිස් සමාජ කරන හිතට එකහව කරන අවංක ප්‍රයත්න තුළින් පමණකි.

**සංජය**

# රණවිරුවෙකුට මංගල සීනු හැඬවේ

## මේජර් දුෂ්‍යන්ත යාපා



මේජර් දුෂ්‍යන්ත සිය අතගත් දර්ශනී සමග



නව යුවළ විවාහයට අත්සන් තබමින්



විවාහයට අත්සන් කළ දින නව යුවළ විහාරස්ථානයක දී මල් පුදා ආගමික වතාවත් ඉටු කළ අයුරු



දුෂ්‍යන්ත යාපා ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් නිහාල් ජයසිංහ මහතා සමග අපි වෙනුවෙන් අපි සංදර්ශනයට සහභාගි වූ දා

**මේ**ජර් දුෂ්‍යන්ත යාපා රාගම රණවිරු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ පරිගණක අංශය මෙහෙයවන ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ඔහුගේ දෑසම නොපෙනේ. දෑසම අන්ධ පුද්ගලයෙකු පරිගණක විශේෂඥයෙකු වන්නේ කෙසේදැයි බොහෝ දෙනා පුදුමයට පත් කරවන කාරණයකි. එහෙත් අපට කෙසේ වුවද මේජර් දුෂ්‍යන්තට පරිගණක තාක්ෂණය එතරම් අරුමැති දෙයක් නොවේ.

දුෂ්‍යන්ත සැබෑ රණවිරුවෙකි. ඔහුට සිය දෑසෙහි පෙනීම අහිමිවූයේ රට මුදාගැන්මට කැපවී හමුදාවට බැඳුණු පසු උතුරේ රණබිමේ කොටි සංවිධානයට එරෙහිව වසර ගණනකට පෙර ක්‍රියාත්මක වූ ජයසිකුරු මෙහෙයුමේ නිරතවීමෙනි. මාන්කුලම් අත්පත් කරගන්නට කළ ඒ දරුණු සටනේදී වූ පිපිරීමකින් ඔහුගේ මුහුණට වූ තුවාල නිසා දෑසේම පෙනීම නැතිවී ගියේය. අත්පා අහිමි වෙනවාට වඩා විශාල සංතාපයක් දෑස අහිමි වූ කෙනෙකුට අත්වන බව අපි අසා ඇත්තෙමු. එය කෙතරම් දැයි දන්නේ දෑස අහිමි වූ අය පමණකි. එහෙත් දුෂ්‍යන්ත එන ඕනෑම දුක් කරදරයක් දරා ගන්නට හැකි මානසිකත්වයෙන් පිරිපුන් අයෙකි. ඔහු තම ආබාධිත බව අවාසියක් ලෙස පිළිගැන්මට සූදානම් නොවී ය.

ඉන්දියාවට ගොස් අක්ෂි ශෛල්‍ය කර්මයක් කළ ද ඇස්වල පෙනීම ආපසු නොලැබිණ. එංගලන්තයේ සරේ ප්‍රාන්තයේ පිහිටි ගිල්පර්ඩ් රෝහලෙන්ද ඇස් පරීක්ෂා කළ නමුත් පෙනීම නොලැබෙන බව ඔවුන් කියා ඇත. ඊට හේතුව ඇසේ දෘශ්‍ය නහර හානි වී ඇති නිසා බව දැනගන්නට ලැබිණ.

1974 ජූනි මස 14 වන දින දංකොටුවේ දී උපත ලද දුෂ්‍යන්ත වෙන්නප්පුව ජෝෂප් වාස් විදුහලෙන් අධ්‍යාපනය හැදෑරීය. ඔහුගේ පියාවන කපිතාන් සමරසිංහ යාපා ද යුද හමුදාවේ සේවය කළේ ය.

සටන් බිමේ ආබාධිත සෙබලුන් පුනරුත්ථාපනය කරන වැඩ සටහනට අනුව මධ්‍යස්ථානය මගින් දුෂ්‍යන්ත කොළඹ කොම්පඤ්ඤ වීදියේ අඳ පුද්ගලයින් පුහුණු කරන ආයතනයට යවන ලදී. එහිදී දෑස නොපෙනුනත් පරිගණකයක් මනාව පාලනය කිරීමට උගත හැකි බව ඔහුට අවබෝධ විය. ඉන්පෙර පරිගණක ශිල්පය හදාරා නැතිමුත් ඔහු ඉක්මනින් එය ග්‍රහණය කළේය. අද මේජර් දුෂ්‍යන්ත යාපා රාගම රණවිරු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන්නේ ය.

ඔහු බොහෝ කටයුතු වලට පරිගණකය මනා ලෙස මෙහෙයවයි. එසේම බොහෝ රටවල වෙසෙන ඔහුගේ හිතවතුන් හා සම්බන්ධකම් පවත්වන්නේ පරිගණකය තුළිනි. ඔහුට යවන විද්‍යුත් පණිවුඩයකට ඒ මොහොතේම සැනින් පිළිතුරු එවන්නට තරම් දෑස් පෙනෙන කෙනෙකුට වඩා දුෂ්‍යන්ත දක්ෂ ය.

දුෂ්‍යන්ත දක්ෂ ක්‍රීඩකයෙකි. දෑස නොපෙනී ගියාට පසුත් ක්‍රීඩා කෞශල්‍ය අත් නොහැරිය යුතුයයි ඔහු සිතුවේය. එය එසේම විය. ඔහු හොඳ දුනුවායෙකි. එසේම ඉලක්කයට වෙඩි තබන්නෙකි. දුර පැනීමේ දක්ෂයෙකි. දැනට ශ්‍රීලංකාවේ ආබාධිතයින්ගේ මළල ක්‍රීඩාවන්හිදී ඔහු තැබූ ක්‍රීඩා වාර්තා තවම කිසිවෙකු බිඳ හෙළා නැත. ගිය වසරේ ඔහු ලන්ඩනයට පැමිණ සිටියේ බ්‍රිතාන්‍ය දුනු ශිල්පීන්ගේ සමාජයෙන් ලත් ආරාධනාවක් මත ය.

ම්ලේච්ඡ ත්‍රස්තවාදීන් පිරිසක් විසින් වෛරය පෙරදැරි කරගෙන ඇතිකරන ලද ශාපලත් කුරිරි යුද්ධය තුළින් අප රටට නැතිවූ දේ බොහෝය. මිනිස් ජීවිත, ශරීරාංග මෙන්ම පුද්ගලයින්ගේ පෙනීම හා මානසිකත්වයද එය සොරා ගත්තේය. මේජර් දුෂ්‍යන්ත යාපා වැනි රණවිරුවන්ට අප ණයගැති වන්නේ ඒ කුරිරු ත්‍රස්තවාදය අප දේශයෙන් තුරන්කරන්නට ඔවුන් සැපයූ අමිළ දායකත්වය නිසා ය.

මේජර් දුෂ්‍යන්ත විවාහවන්නේ ඔහුගේ දෑසේ පෙනීම නැති වූ පසු හමුවී ඔහු හා පෙමින් බැඳුණු යුවතියක සමගය. දර්ශණී නම් වන ඇය පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්‍යයාලයේ සේවය කරන්නීය. විවා මංගල්‍යය හමුදා උත්සවාකාරයෙන් ලබන ඔක්තෝබර් මස 1 වෙනි දින පවත්වන්නට නියමිත බව දුෂ්‍යන්ත කියයි. මේ මනරම් විවාහයට මේ යුවතිපතීන්ට ලොව පුරා විහිද විසිර සිටින දහස් සංඛ්‍යාත දේශප්‍රේමීන් සමග අපි ද ඉත සිතින් සුබාශිංසනය කරමු !

**♦ ලංකාවිත්ති**